# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2117/57 – 2019 අප්‍රේල් 05 වැනි සිකුරාදා – 2019.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ජූලි මස 24 වැනි දින අංක 1820/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 242 හා 2013.07.17 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2013/UDA/40.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: මහ/ඉ/අත්/UDA/335.
2019 අප්‍රේල් මස 01 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අංක 496 බී - කොට්ටාව නගරය සහ අංක 531 ඒ පන්නිපිටිය දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, කොට්ටාව, පන්නිපිටිය, දෙපානම සහ ඇරැව්වල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9397 හා 2018.12.08 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 290 – පරණ කොට්ටාව පාරේ වරිපනම් අංක 477 සහ 479 – ප්‍රමාණය: හෙක්. 0.0008 ක් පමණ**

උතුරට: පරණ කොට්ටාව පාරේ වරිපනම් අංක 477 සහ 479 හි කොටස් සහ පාර; නැගෙනහිරට: කැබලි අංක 97 සහ 291; දකුණට: කැබලි අංක 291; බටහිරට: කැබලි අංක 291 සහ පරණ කොට්ටාව පාරේ වරිපනම් අංක 477 හා 479.

04 - 681